# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2358/73 - 2023 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2023.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වගන්තිය යටතේ වූ පවරා ගැනීමේ නියෝගය අවලංගු කිරීම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වගන්තිය යටතේ එවකට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල ප්‍රකාර 2011.09.30 දිනැති අංක 1725/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ 15 (1) වන වගන්තිය යටතේ නියෝගයෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තර ලෙස දක්වා ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු කරනු ලැබීය.

එනමුත්, නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන කාර්යයන් සඳහා අධිකාරියට එකී දේපළ අවශ්‍ය නොවන බවට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වන ප්‍රසන්න රණතුංග වන මම තීරණය කරන හෙයින්, අංක 1725/29 සහ 2011.09.30 වැනි දින රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත 15 (1) වන වගන්තිය යටතේ වූ නියෝගය මෙයින් අවලංගු කරමි.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය (පා.ම).

2023 නොවැම්බර් මස 13 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කුරුඳුවත්ත කොට්ඨාසයේ පිහිටියා වූ ද, මිනුම්පති විසින් පිළියෙල කරන ලද 1948.02.18 දිනැති කුරුඳුවත්ත කොට්ඨාසයේ රජයේ ඉඩම් පිඹුරු අංක 02 හි කැබිලි අංක 1 ලෙස සවිස්තරව පෙන්නුම් කර ඇත්තා වූ ද, උතුරට - ධර්මපාල මාවත (ටර්ට් පාර) හා එෆ්.ආර්. සේනානායක මාවත, නැගෙනහිරට - දොස්තර සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, දකුණට - ආනන්ද කුමාරස්වාමි මාවත, බහිරට - සර් මාකස් ප්‍රනාන්දු මාවතෙන් ද මායිම් වන්නා වූ මහජන පුස්තකාලය හා ඊට යාබදව පිහිටි ස්මාරකය හා ඊට අදාළ කාර්යයන් සඳහා වෙන් වූ ඉඩම් කොටස හැර, දළ වශයෙන් අක්කර 54 (පනස් හතර) ක් විශාලත්වයෙන් යුත් ඉඩම.

EOG 11 - 0190

1A - G 40781 — 07 (2023/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*